**ශීර්ෂය - 248 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**
**---------------------------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271 / 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------**පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.7 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේදී ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් අනුව වියදම් සාරාංශය ACA-2 ආකෘතියෙහි සඳහන් පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,168,500,000 ලෙසද මුළු පුනරාවර්තන වියදම රු.936,801,576 ක් ලෙස දක්වා තිබුණි. වියදම් ප්‍රකාශනය ACA-2(ii) අනුව එය පිළිවෙළින් රු.1,159,800,000 ක් සහ රු.928,392,355 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි දත්ත ඇතුලත් කිරීමට කටයුතු කිරීම. | පෙන්වාදීම අගය කොට සලකමි. ප්‍රතිපාදනවල අගය හා වර්ෂයේ වියදම්වල අගය අතපසුවීමකින් එකතුකර නොමැති නිසා සිදු වී ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් යටතේ වැය ශීර්ෂය අනුව මූලධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා රු.107,562,052 ක් වැය කර ඇතත් මූල්‍ය නොවන වත්කම් (ACA-6) යටතේ මිලදී ගැනීම් ලෙස එය රු.56,420,700 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිකෙරෙමින් පවතින වත්කම් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීමට කටයුතු කිරීම. | මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ රු.107,562,052 දක්වා ඇතත් ඒ තුළ ඉදි කෙරෙමින් පවතින ඒවා ද ඇතුලත් වේ. නමුත් ACA- 6 යටතේ දක්වා ඇති මුදල වූ රු.56,420,700 සත්‍ය වශයෙන් ම මිල දී ගත් වටිනාකම වේ. |
| (ආ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් රු.982,032,375 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,371,338,801 ක් ලෙස ගැලපීමට අදාල ජ'නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. | ගැලපීම් කිරීමට අදාල ජ'නල් සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. | 2018 වර්ෂයේ සකස් කරන ලද අවසාන ගිණුම් අඩුපාඩු සහිත වූ බැවින් 2018 දෙසැම්බර් 31 දිනට නිවැරදි ශේෂය වූ රු.1,371,338,801 මූල්‍ය නොවන වත්කම් ලෙස |

| | | | |
|---|---|---|---|
| | | | 2019 වර්ෂයේ ගිණුම්වලට ඇතුලත් කොට ඇත. එම අගයන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල දැක්වෙන අගයට සමාන වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු.45,567,770.77 ක් වටිනා ගොඩනැගිලි සහ ඉදිකිරීම්, කෙරීගෙන යන වැඩ වටිනාකම් යටතේ මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ගෙන නොතිබුණි. | නිවැරදි වර්ගීකරණය යටතේ දැක්වීමට කටයුතු කිරීම. | ACA-6 පිළියෙල කිරීමේ දී මෙම අගය කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස දක්වා ඇති අතර ACA-6 මුළු එකතුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර අවසාන ගිණුම් පිළියෙල කර ඇත. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අග්‍රිම ගිණුමේ වර්ෂය ආරම්භක ශේෂය වූ රු.29,735,446 ක මුදල සහ අග්‍රිම ගිණුමේ දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර මුද්‍රිත ශේෂ අතර වෙනස වූ රු.45,475,138 ක මුදල යන දෙකෙහි එකතුව වූ රු.75,210,584 ක මුදල ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා තිබුණි. | අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. | 7041629 බැංකු ගිණුමේ දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය 2019 වර්ෂයේ දී අග්‍රිම ලැබීමක් ලෙස බලය පවරා ගැනීමත්, 2019 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරයට යැවූ අවසන් චෙක්පත හා වැරදීමකින් CIGAS වැඩසටහනට රු.3,355,000 අගය ඇතුලත් ව එකතුව රු.45,475,138 මුදල හා රු.29,735,446 හි එකතුව ආදායම් නොවන ලැබීම් ලෙසද දක්වා ඇත. |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳීම් ප්‍රකාශයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ණය හා අත්තිකාරම් ලේඛණය (CC – 10) සහ අත්තිකාරම් ගිණුමට අදාල සැසඳීම් ප්‍රකාශණය සමඟ ඉදිරිපත් කර ඇති කේවල ශේෂ උප ලේඛණයේ සඳහන් ණය ශේෂ අතර නොගැලපීම් තිබූ අවස්ථා 09 ක් විය. | ණය හා අත්තිකාරම් ලේඛනය නිවැරදිව සටහන් කිරීමට කටයුතු කිරීම. | මෙම වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය, ණය හා අත්තිකාරම් ලේඛණය (සී.සී. 10) ප්‍රකාරව රු.194,703 ක් වූ අතර එම ශේෂය සැසඳීම් ප්‍රකාශනයේ කේවල ශේෂ උපලේඛණයට සටහන් කිරීමේදී රු.209,885 ක් ලෙස ගෙන තිබුණි. | ණය හා අත්තිකාරම් ලේඛනය නිවැරදිව සකස් කිරීමට කටයුතු කිරීම. | අතපසු වීමකින් මෙම මහතාගේ ණය ශේෂය කේවල ශේෂ ලයිස්තුවෙහි දක්වා ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.6.5 අග්‍රිම ශේෂය

--------------

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------------------------------ |
| (අ) | දෙපාර්තමේන්තු ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව හඳුනානොගත් අග්‍රිම ශේෂයන් දෙකක එකතුව රු. 115,059,294,193 ක්ද 248 ශීර්ෂය යටතේ රු. 26,897,295 ක හර ශේෂයක් පෙන්නුම් කෙරුණි. මෙම ශේෂ අග්‍රිම ගිණුම පිළිබඳ ACA- 3 ආකෘතියෙන්ද නිරූපණය නොවූ අතර මේ සම්බන්ධ පැහැදිලි කිරීම්ද ඉදිරිපත් නොවිය. | නිවැරදි දත්ත ඇතුලත් කිරීමට කටයුතු කිරීම. | CIGAS පරිගණක වැඩ සටහන තුළින් ශේෂ පිරික්සීමේ දී පිළියෙල වන අගයන් බවත්, මේවා CIGAS වැඩ සටහන වර්ෂ අවසානයේ අවසන් කිරීමේ දී (Year End) අග්‍රිම පියවීම පිළිබඳ ව ඉදිරිපත් කල චෙක්පත්වල අගයන් ඇතුලත් කිරීමේ දී දැනගත් අතර, ඉදිරියේ දී (Year End) මෙම අගයන් ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි |
| (ආ) | විෂයයන් 3කට අදාලව දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ සඳහන් අගයන් සහ භාණ්ඩාගාරයේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ සඳහන් අගයන් අතර එකතුව රු.115,898,788,636 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පොත් සමග සැසඳීමට කටයුතු කිරීම. | මෙම ඡේදය පැහැදිලි කර කඩිනමින් පිළිතුරු ලබාදීමට අපේක්ෂා කරමි. |

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හානි පිළිබඳ ලේඛනය<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම. | පිළිතුරු ඉදිරිපත් නොවිය. |
| (ආ) | වාහන ලොග් පොත්<br>මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව ලොග් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම. | මේ පිළිබඳව නිසි පරිදි කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. |

### 1.6.7 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු විය. එසේම එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගණන්දීමේ නිලධාරීන් විසින් සිදු කල යුතු සහතිකවීම් යටතේ පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් මේ වන විට ප්‍රමාණවත් කාර්යයක් සිදු කර ඇති අතර, ඉදිරියේ දී ඵලදායි ලෙස එම කාර්යයන් සිදු කරන බව දන්වා සිටිමි. තිරසාර අරමුණු ළඟා කර ගැනීම සඳහා පාලන වාර්තාවට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්ම සකස් |

| | | | |
|---|---|---|---|
| | වෙත ඉදිරිපත් කළ යුතු විය. එහෙත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | කර ඉදිරි කටයුතු සිදු කිරීමට, කටයුතු කර ඇත. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදීමේ ප්‍රමාදයන් හා පිළිතුරු ලබා නොදීම් සිදුවී තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රාදේශීය කාර්යාල විශාල සංඛ්‍යාවක් ඇති බැවින් යම් ප්‍රමාදයක් සිදු වුවද ඉදිරියේදී එම ගැටළු නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.6.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ

| නිරීක්ෂණ | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 104(3) සහ 104(4) | අලාභ හානි පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ නම් මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක්ද මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව අලාභහානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් එකතුව රු.1,402,956 ක් පාඩු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු සිදුකර නොමැති අවස්ථා 05ක් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කිරීම. | පිළිතුර ඉදිරිපත් වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය | සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ආදායම් සංකේත සඳහා මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. | මෙය ඉදිරියේ දී නිවැරදි ව යැවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4 ඡේදය. | දෙපාර්තමේන්තුව විසින් ඉටුකල යුතු කාර්යභාරයේ නිමවුම හා ප්‍රතිඵල පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPI) ප්‍රකාශයට පත්කර නොතිබුණි. | 2017 ජූලි 25 දිනැති අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම. | 2020 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. |

**1.6.9 අවිධිමත් ගනුදෙනු**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------- |
|---|---|---|---|
| (අ) | සංචාරක සේවා යටතේ "සංචාරක යාත්‍රා මෙහෙයුම්" සේවාවන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි නොවූ පුද්ගලික සමාගමක් යටතේ ක්‍රියාත්මක වන යාත්‍රා 8 ක් සඳහා රු.බි. 11 සුරාබදු බලපත්‍ර (භෝජනාගාර බලපත්‍ර) ලබාදීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. ඒ අනුව යාත්‍රා 5 ක් සී/ස වෙළඳ හා නාවික සමාගමේ ලියාපදිංචි වී ඇතිබවට සනාථකිරීම් ඉදිරිපත් කර නොතිබුණි. ලියාපදිංචි සහතික ඉදිරිපත් කරන ලද යාත්‍රාවලින් යාත්‍රා දෙකක කාලය 2019 පෙබරවාරි 11 දිනෙන් සහ 2019 මැයි 02 දිනෙන් අවසන් වී තිබුණි. සී/ස වෙළඳ හා නාවික සමාගම යටතේ වෙළඳ නැව් බඩු ප්‍රවාහනය | සුරාබදු ආඥා පනතේ 25 වගන්තිය ප්‍රකාරව අදාල රීති සම්පාදනය කරගැනීමට කටයුතු කිරීම. | 2019 මාර්තු 23 හා 24 දෙදින මාතර වැලිගම නගර ශාලාවේදි පැවති එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහනේදි ගරු මුදල් අමාත්‍යතුමා විසින් ලබාදුන් නියෝග පරිදි සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව, සුරාබදු ආඥා පනතේ 28 (අ) වගන්තිය මගින් ගරු මුදල් අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සංචාරක ප්‍රවර්ධනය උදෙසා සේල් ලංකා චාටර් (පුද්ගලික) සමාගම නමින් ලියාපදංචි වී ඇති මගී යාත්‍රාවන් 08ක් සඳහා නව බලපත්‍ර වශයෙන් රු.බි. 11 භෝජනාගාර බලපත්‍ර ලබාදෙන ලෙසට අනුමත ලිපි ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| | කිරීම සඳහා මෙම යාත්‍රා ලියාපදිංචි වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. සංචාරක යාත්‍රා මෙහෙයුම් සඳහා සුරාබදු බලපත්‍ර ලබාදීමට අදාලව සුරාබදු ආඥා පනතේ 25 වගන්තිය ප්‍රකාරව රීති සම්පාදනය කිරීමක්ද දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි. | | |
| (ආ) | 1979 ඔක්තෝබර් 12 දින අංක 58 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් විශේෂ කොන්දේසි 9 (2) ප්‍රකාරව දිසාපතිවරයා නියම කරන ලද ටෙන්ඩර් මුදල ගෙවීමට ටෙන්ඩර්කරුවෙකු එකඟකරවා ගතනොහැකි අවස්ථාවලදි අළුතෙන් ටෙන්ඩර්පත් කැඳවීමට කටයුතු කලයුතු විය. එහෙත් රත්නපුර අංක 01 රා තැබෑරුම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. රත්නපුර අංක 01 රා තැබෑරුම වෙන්දේසි කිරීමේදි රු.46,089,120 ක තක්සේරු වටිනාකමෙන් සියයට 50 කට වඩා අඩු අගයක් සහිත රු.16,500,000 ක් සහ රු.21,600,000 ක ටෙන්ඩර් දෙකක් ඉදිරිපත් වී තිබුණි. මෙහිදී නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු නොකර රු.21,600,000 කට ඉල්ලුම් කර ඇති ටෙන්ඩර්කරුගේ ඉල්ලීම් සලකා බලමින් දෙපාර්තමේන්තුව විසින් පසුගිය වර්ෂ 03 හි ටෙන්ඩරය පිරිනමා ඇති මුදලෙහි සාමාන්‍ය අගය සැලකිල්ලට ගෙන ටෙන්ඩර් වටිනාකම අඩු කිරීමට කටයුතු කර තිබුණි. එම අවස්ථාවේදීද තක්සේරුකරු ටෙන්ඩර් මුදල නැවත ප්‍රතික්ෂේප කර අභියාචනා කර තිබුණි. ඒ අනුව ද්විපුද්ගල කමිටුවක් විසින් එකී අභියාචනය සැලකිල්ලට ගෙන පසුගිය වර්ෂ 03 හි ඇස්තමේන්තුවල සාමාන්‍ය අගය පදනම් කරගෙන රු.28,000,000 ක මුදලකට තරඟකාරී ටෙන්ඩර් කිරීම්වලින් බැහැරව ටෙන්ඩරය ලබාදීමට කටයුතු කර තිබීම ප්‍රශ්ණගත කරුණක් විය. | අදාල නීති ප්‍රකාරව කටයුතු කිරීම. | මේ සම්බන්ධයෙන් නැවත ටෙන්ඩර් කැඳවුවද මෙම ක්ෂේත්‍රයේ නියුතු අය පමණක් මිල ගණන් ඉදිරිපත් කරන ලද අතර, වෙනත් ටෙන්ඩර් වලදී මෙන් විවෘත පුද්ගලයන් ඉදිරිපත් නොවූ බැව් මීට පෙර ඇති පූර්වාදර්ශ අනුව පෙනී ගොස් ඇති බැවින්ද නැවත ටෙන්ඩර් කැඳවීම මගින් රජයට ලැබීමට ඇති මුදල තවදුරටත් පමාවන බැවින් ද ඒ අනුව කටයුතු කරන ලදි. |

**1.6.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුරාබදු නිවේදන 902 හි 14 ඡේදය අනුව වෙළඳ සංකීර්ණ සඳහා දෙනු ලබන ර.බි 4 බලපත්‍ර සම්බන්ධයෙන් තම මව් සමාගමේ පසුගිය වර්ෂය සඳහා වාර්ෂික පිරිවැටුම රු.මිලියන 72 ඉක්මවූ බවට වාර්තාවක් පිලිගත් විගණන සමාගමක් ඉදිරිපත් කලයුතු වුවත් පෞද්ගලික වෙළඳ සමාගමක ගණකාධිකාරිවරයා විසින් ශාඛා 7 කට අදාලව මාසික පිරිවැටුම දක්වන ලද ලිපි පමණක් ඉදිරිපත් කර තිබුණි. | සුරාබදු නිවේදන 902 හි 14 ඡේදය අනුව කටයුතු කිරීම. | මේ සම්බන්ධයෙන් අදාල සමාගමෙන් තොරතුරු කැඳවා ඇති අතර, පිළිතුරු ලද විගස ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |
| (ආ) | සුරාබදු නිවේදන 902 හි 13 (ඌ) ඡේදය අනුව පාසල් හා ප්‍රසිද්ධ පූජනීය ස්ථානවලට තිබිය යුතු නිශ්චිත දුර ප්‍රමාණ කඩකර ඇති බවට පැමිණිලි ලැබී ඇති විටක රජයේ මිනුම්දෝරු අධිකාරිගේ වාර්තාවක් ලබාගෙන සත්‍ය දුර නිර්ණය කලයුතු වුවත් වැලිගම සහ ත්‍රිකුණාමලය යන වෙළඳ සංකීර්ණ සඳහා පැමිණිලි ලැබී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි | සුරාබදු නිවේදන 902 හි 13 (ඌ) ඡේදය අනුව කටයුතු කිරීම. | කාගිල්ස් ෆුඩ්සිටි වැලිගම ස්ථානය සහ ත්‍රිකුණාමලය සම්බන්ධයෙන් රජයේ මැනුම් අධිකාරි වෙතින් ලබාගත් මැනුම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශිය ලේකම් වැලිගම සහ ත්‍රිකුණාමලය වෙත දන්වා ඇති අතර, රජයේ මැනුම් අධිකාරීගේ වාර්තාව අනුව, අවශ්‍ය වන්නේ නම් බලපත්‍රය අවලංගු කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2019 සැප්තැම්බර් 30 දිනට සමාගම් 02 ක් විසින් විධිවිධාන ප්‍රකාරව නිකුත් කර තිබූ ඇනවුමේ සඳහන් ආනයනික ස්ප්‍රීතු තොගය ඉක්මවා තොග ලීටර් 3,760,319.53 ක් ආනයනය කර තිබුණි. සමාගම් 3 කට අදාලව රේගු දෙපාර්තම්න්තුවේ දත්ත අනුව සහ ආනයනික ප්‍රමාණය අතර තොග ලීටර් 4,553,811.7 ක ප්‍රමාණාත්මක වෙනසක් නිරීක්ෂණය විය.<br>එලෙස වෙනස්කම් පැවතීම හේතුවෙන් ස්ප්‍රීතු ආනයනය කිරීමේදී ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව, සුරාබදු | ඊතයිල් ස්ප්‍රීතු ආනයනය කිරීමේදී ඍජු අධීක්ෂණයට ලක් කිරීමත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සහ රේගු දෙපාර්තමේන්තුව සමග අන්තර් සබඳතා පවත්වාගෙන යාමටත් කටයුතු කිරීම. | ඇනවුම් කරනු ලබන අවස්ථාවනහී දි අනුමත ස්ප්‍රීතු ප්‍රමාණයට වඩා සමහර අවස්ථාවලදී බහාලුම්වල වැඩිපුර යම්කිසි ප්‍රමාණයක් තිබෙන බව නිවැරදිවේ. එයට හේතු වී ඇත්තේ ප්‍රවාහනයේදී සිදුවන අපතය සඳහා අදාල විදේශීය ආයතන වැඩිපුර ප්‍රමාණයක් බහාලුම්වල අන්තර්ගත කිරීමත්, ආනයන කරන හා අපනයන කරන රටවල් අතර පවත්නා උෂ්ණත්ව වෙනස්වීම් බවත් නිරීක්ෂණය කරන ලදී. ස්ප්‍රීතු නිෂ්පාදනාගාරවලට ප්‍රවාහනය |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව විසින් නිසි නියාමනයක් සිදුකරන්නේද යන්න පිළිබඳව ගැටළු සහගත විය. | | කල පසුව නිෂ්පාදනාගාරවලදී භෞතිකව පරීක්ෂා කර, ආනයනය කිරීමේදී වැඩිපුර ලැබී ඇති ස්ප්‍රීතු ප්‍රමාණය සඳහා බදු මුදල් අය කරනු ලබන අතර, එම වැඩිපුර ලැබුණු ස්ප්‍රීතු ප්‍රමාණය හා ඒ සඳහා අයකල බදු මුදල් පිළිබඳව රේගු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවනු ලබයි. |
| (ඇ) | වර්ෂයකට අවශ්‍ය වන ඊතයිල් මධ්‍යසාර ප්‍රමාණය පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත හඳුනාගැනීමක් සිදුකර නොතිබූ අතර වැඩිපුර ආනයනය සම්බන්ධයෙන් දඩ මුදලක් පැනවීමට අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව අයදුම් කරන ප්‍රමාණයට අතිරේකව වැඩිපුර ආනයනය කිරීමට ඉඩ සැලසි ඇති බව නිරීක්ෂණය කෙරේ. | අවශ්‍ය නීති රීති සකස් කිරීම. | දඩ මුදල් අයකිරිම සඳහා නිතීමය ප්‍රතිපාදන සැලසී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. ආනයනික තොග සහ නිෂ්පාදනයට යොදා ගන්නා තොග පිළිබඳව සියළුම නිෂ්පාදනාගාර භාර ස්ථානාධිපතිවරුන් ආනයනය සඳහා අවශ්‍ය වන ස්ප්‍රීතු ප්‍රමාණය නිර්දේශ කර ලේඛන ඉදිරිපත් කරනු ලැබේ. ස්ප්‍රීතු ආනයනය සම්බන්ධයෙන් සියලු තොරතුරු පරිගණක ගත කිරිමට කටයුතු කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූලික ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 135,000 ක් වූ අතර දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද ආදායම රු. මිලියන 115,417 ක් විය. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 85 ක් විය. | මුදල් රෙගුලාසි 128(1) (අ) ප්‍රකාරව අයවැය ඇස්තමේන්තුව තාත්වික ලෙස පිළියෙල කිරීම. | මෙම වසරේ සුරාබදු ආදායම නිෂ්පාදනය මත සැලකූවිට පසුගිය වසරට එනම් 2018 වර්ෂයට සාපේක්ෂව ආසන්න වශයෙන් සියයට 5 පමණ වර්ධනයක් නිරීක්ෂණය විය. නමුත් මුදල් මත පදනම්ව සුරාබදු ආදායම සැලකූ විට සියයට 1 වර්ධනයක් නිරීක්ෂණය විය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රැස්කරන ලද ශුද්ධ සුරාබදු ආදායම පිළිබඳ විස්තර පහත පරිදි විය. ඒ අනුව 2016 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ ආදායමේ ප්‍රමාණාත්මක අඩුවීමක්<br><br>වර්ෂය \| සුරාබදු ආදායම රු. බිලියන \| ප්‍රතිශත වෙනස<br>------- \| ----------- \| -------<br>2015 \| 105.2 \| 52.2<br>2016 \| 120.2 \| 14.2<br>2017 \| 113.2 \| (5.8)<br>2018 \| 113.8 \| 0.5<br>2019 \| 115.3 \| 1.3<br><br>නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් නිවැරදි ආදායම් ඇස්තමේන්තු පිළයෙල කිරීම හා 2015 ජුලි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුගමනය කර ආදායම් පරිපාලනය වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම. | මෙම වසරේ සුරාබදු ආදායම නිෂ්පාදනය මත සැලකූවිට පසුගිය වසරට එනම් 2018 වර්ෂයට සාපේක්ෂව ආසන්න වශයෙන් සියයට 5 ක පමණ වර්ධනයක් නිරීක්ෂණය වේ. නමුත් මුදල් මත පදනම්ව සුරාබදු ආදායම සැලකූ විට සියයට 1 වර්ධනයක් නිරීක්ෂණය විය. |
| (ඇ) | සුරාබදු නිවේදන අංක 902 ප්‍රකාරව නියමිත දින බදු මුදල් නොගෙවීමේදී අධිභාර කරනු ලබන අතර එසේ කටයුතු නොකල සමාගම් 9 කින් එකතුව රු.39,514 ක අධිභාර අයකර නොතිබූ අතර අධිභාර මුදල නියමිත පරිදි ගණනය නොකිරීම හේතුවෙන් සමාගම් 4 කට අදාල රු.42,643 ක අධිභාර මුදලක් අහිමි වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම | කඩිනමින් පිළිතුරු ලබා දීමට අපේක්ෂා කරමි. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට සමාගම් 05 කින් වසර 05 ඉක්මවා තිබූ හිඟ බදු මුදල්වල එකතුව රු. මිලියන 479.99 වන අතර ප්‍රමාද ගාස්තු එකතුව රු. මිලියන 1,896.39 ක් විය. සමාගම් 2 කට අදාලව නඩු පවරා තිබූ අතර සමාගම් 3 ක් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති වෙත යොමුකර ඇති බව දැක්වෙතත් ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | කඩිනමින් පිළිතුරු ලබා දීමට අපේක්ෂා කරමි |
| (ඉ) | හිඟ ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් මු.රෙ. 176 (2), 3 ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නැත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති ACA-1 (1) ආකෘති පත්‍රයට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂය රු. 3,799,189,371 ක් වූ අතර හිඟ ආදායම් වාර්තාවට අනුව ශේෂය රු. 3,319,192,027 ක් වූයෙන් රු.479,997,344 ක වෙනසක් නිරීක්ෂණය විය | හිඟ ආදායම් පිළිබඳව දෙසැම්බර් 31 දිනට තත්ත්වය වාර්තා කිරීමට කටයුතු කිරීම. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ACA-1(1) ආකෘති පත්‍රය සඳහා හිඟ ආදායම් ශේෂ ලබාදීමේදී, 2019 දෙසැම්බර් 31 දිනට පවතින මුදල් පදනම මත සකස් කරන අතර, ආදායම් වාර්තා විගණකාධිපති හා මුදල් අමාත්‍යාංශය වෙත ලබාදීමේදී එම ලබාදෙනු ලබන දිනය දක්වා පසුගිය වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට අදාළව ලැබෙන හිඟ බදු මුදල් අඩු කිරීමෙන් පසුව ශේෂය ලබා ගනී. එම නිසා මෙසේ වෙනස්කම් සිදුවී ඇති බව වාර්තා කරමි. |
| (උ) | දුම්කොළ බදු පනතට අනුව බදු අය නොකිරීම. | | |
| (i) | 1999 අංක 8 දරණ දුම්කොළ බදු පනතේ 2 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරණු ලබන සෑම සුරුට්ටුවක්, බීඩියක් හා සෑම පයිප්ප දුම්කොළ කිලෝග්‍රැමයක් සඳහාම බද්දක් පනවා අය කල යුතු වුවද, නිෂ්පාදනය කරනු ලබන සුරුට්ටු සහ බීඩි සම්බන්ධයෙන් කරණු ලැබූ නියදි විගණන පරීක්ෂාවේදී එවැනි බද්දක් අයකරනු නොලබන බව නිරීක්ෂණය විය. 2019 වර්ෂය වන විට බීඩි හා සුරුට්ටු නිෂ්පාදන සඳහා බීඩි හා සුරුට්ටු කර්මාන්තකරුවන් 500 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබුණි. ඉකුත් වර්ෂ 4 ක කාලය තුල එම කර්මාන්තවල බීඩි සහ සුරුට්ටු නිෂ්පාදනය දල වශයෙන් ඒකක බිලියන 16 ක් පමණ විය. විගණන නියැදියට අනුව තෝරාගත් ආයතන 30 ක 2018/2019 වාර්ෂික බීඩි නිෂ්පාදනය ඒකක 31,348,500 ක් පමණ වූ අතර ලියාපදිංචි වී ඇති ආයතන 518 සැලකිල්ලට ගත් විට වාර්ෂිකව විශාල බදු ආදායමක් රජයට අහිමි වී ගොස් තිබූ බව නිරීක්ෂණය විය. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත අනුව කටයුතු කිරීම. | නිෂ්පාදිත ඒකක බද්දක් අය කර ගැනීම ප්‍රායෝගිකව ගැටළු සහගත බැවින් ඊට විකල්ප ක්‍රමවේදයක් ලෙස බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන දුම්කොළ අමුද්‍රව්‍ය ප්‍රමාණය මත බද්දක් අය කර ගැනීමේ ක්‍රමවේදයක්, යෝජිත දුම්කොළ බදු (සාමාන්‍ය) නියෝග සංශෝධනයේ දී ඇතුලත් කොට ඇත. එම සංශෝධිත නිවේදනය මේ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කොට ඇත. දැනට පවතින ප්‍රතිපාදන අනුව ආනයනික සිගරැට්,සුරුට්ටු හා බීඩි ඒකකයක් (Stick) සඳහා බදු අය කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සිගරට් පරිභෝජනය සඳහා පමණක් දෙපාර්තමේන්තුවේ නියාමනයක් සිදුකෙරෙන බවත් බීඩි පරිභෝජනය සම්බන්ධයෙන් එවැනි නියාමනයක් නොකෙරෙන බවත් නිරීක්ෂණය කෙරේ. තවද බීඩි පරිභෝජනය තුලින් ආඝ්‍රානය වන දුම ශරීරයට අහිතකර ලෙස බලපාන බවත්, නිදන්ගත රෝග සඳහා එය හේතුවක් වන බවත් හඳුනාගෙන තිබේ. තවද, ශ්‍රම බලකායේ ඵලදායීතාවය විශාල වශයෙන් අහිමි වීමට මෙය බලපෑමක් වන බවද හඳුනාගෙන තිබේ. එම නිසා බීඩි නිෂ්පාදනය නියාමනය කෙරෙහිද අවධානය යොමුකිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ. | දුම්කොළ බදු පනතට අනුකූලව කටයුතු කිරීම. | බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය ගෘහ කර්මාන්තයක් ලෙස පෘතුලව ව්‍යාප්තව ඇති බැවින් මෙකී නිෂ්පාදන හා ගබඩා කටයුතු මත්පැන් කර්මාන්තයේ මෙන් ඍජු අධීක්ෂණයට ලක් කිරීම ප්‍රායෝගිකව අපහසු තත්ත්වයක පවතී. |
| (උ) | වැඩ තහනමට ලක් වූ හා සේවයෙන් පහකල නිලධාරීන් 09 දෙනෙකුගෙන් අය විය යුතු රු.683,925 ක ණය ශේෂය වසර 05 ක් ඉක්මවා තිබුණු අතර ඉන් නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.183,305 ක ශේෂ වසර 4 ත් 5 ත් අතර කාලයක සිට පැවත එන ශේෂයන් විය. | ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කිරීම. | වැඩ තහනමට ලක් වූ නිලධාරීන්, සේවය හැර ගිය නිලධාරීන්ගේ සහ මිය ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ අය කර ගැනිම සඳහා කටයුතු යොදා ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් **7** ක් සඳහා එකතුව රු.මිලියන 507.2 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම වැය විෂයයන්ට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 124.8 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 සිට සියයට 84 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම. | පසුගිය වසරේ සිදු වූ පාස්කු ප්‍රහාර සිද්ධිය නිසා අපේක්ෂිත ඉලක්ක කරා ළගාවීමට නොහැකිවීම හේතුවෙන් වැය විෂයයන් කිහිපයක ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 58.45 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම. | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමක් සිදු නොවූ බැවින් උක්ත ප්‍රතිපාදන උපයෝජනය නොවීය. නමුත් 2019 වර්ෂයේ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන මිල දී ගැනීමක් සිදු කල අතර එය 1406 හ 2108 වැය විෂයයන් මගින් ගෙවීම් කටයුතු සිදු කර ගෙන යනු ලැබේ. මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘතිය දැනට කරගෙන යනු ලබන අතර ගෙවීම් කිරීම සඳහා කටයුතු නිම කර නොමැත. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 11 කට අදාලව අවස්ථා 27 කදී ලබාගෙන ඇති සැපයුම් හා සේවාවන් වල එකතුව රු.3,430,288 ක්ද සහ ප්‍රාග්ධන වැය විෂයයන් 4 කට අදාලව අවස්ථා 4 කදී ලබාගෙන ඇති සේවාවල එකතුව රු.1,468,150 ක්ද බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 ප්‍රකාරව බැඳීම් වලට එළඹීම. | අතපසුවීමකින් මෙවැන්නක් සිදු වී ඇති අතර ඉදිරියේ දී ඇති නොවීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව සටහන් අංක (iii) යටතේ වාර්තා කර නොමැති බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2020 වර්ෂයේදී නිරවුල් නොකල යුතුය. එහෙත් 2019 වර්ෂයේදී එසේ වාර්තා නොකරන ලද අවස්ථා 15 කට අදාලව එකතුව රු.4,898,437 ක් 2020 වර්ෂය තුලදී නිරවුල් කර තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 ප්‍රකාරව කටයුතු කිරීම. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපදාන නොමැති විට වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු බව දැක්වෙතත් වැය විෂය අංක 1406 සඳහා ප්‍රතිපදාන ඉතිරිය රු.43,903 ක් පමණක්ව තිබියදී රු.1,847,321 ක් සඳහා බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කිරීම. | 1406 වැය විෂයය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මාරුකර ගැනීමෙන් පසුව අදාල කටයුතු කර ඇත. |

**2.4 තැන්පත් ශේෂයන්**

--------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොන්ත්‍රාත් රඳවුම් 5 ක එකතුව වූ රු.9,946,304 ක් සහ කල් ඉකුත් වූ ටෙන්ඩර් තැන්පතු 5 ක එකතුව රු. 71,000 ක් සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම. | ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් ඉදිරියේ කටයුතු කිරීමට ක්‍රියා කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්ය භාරයන් ඉටු නොකිරීම**

---------------------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ආදායම් වර්ධනය කිරීම සඳහා වූ මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආරක්ෂිත ස්ටිකර් සැපයීම හා ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතියක් සැපයීම හා ස්ථාපිත කර පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂය සඳහා රු.257,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද 2020 වර්ෂය වන තෙක්ම එම ව්‍යාපෘතිය දේශීය නිෂ්පාදන සඳහා ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. | ලයන් බෲවරි සමාගම සහ DCSL සමාගම විසින් ස්ටිකර් ඇලවීමේ උපකරණ අළුතින් නිර්මාණය කර ස්ටිකර් ඇලවීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම මත දේශීය මත්පැන් මත ස්ටිකර් ඇලවීම ආරම්භ කිරීමේ දිනය අවස්ථා දෙකකදී දීර්ඝ කරන ලදී. කොරෝනා වසංගත තත්වය මෙන්ම මත්පැන් නිෂ්පාදක සමාගම් ස්ටිකර් ඇලවීමේ උපකරණ මෙතෙක් සවිකර නොමැති බැවින් නැවතත් ස්ටිකර් ඇලවීමේ දිනය 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීම සඳහා 03/2020 දරණ සුරාබදු නිවේදනය නිකුත් කර ඇත. මෙකී ප්‍රායෝගික හා තාක්ෂණික කරුණු |

| | | |
|---|---|---|
| | | මත 2020 වර්ෂය තුල දේශීය මත්පැන් මත ස්ටිකර් ඇලවීම ආරම්භ කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**
--------------------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රු.210,830,625 ක් වූ ව්‍යාපෘති 05ක මූල්‍ය ප්‍රගතිය 2019 දෙසැම්බර් 31 දින වන විට රු.307,110,968 ක් වූ අතර, අදාල ව්‍යාපෘති 05 සඳහ ාම වන භෞතික ප්‍රගතිය සැළසුම්ගත පරිදි සතුටුදායක මට්ටමක නොවීය. | නියමිත කාල වකවානුව තුල ඉටුකිරීමට කටයුතු කිරීම. | මහනුවර, අම්පාර, පේදුරුතුඩුව සහ මුලතිව් ඉදිකිරීම් ප්‍රමාදයන් පිළිබඳ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව කරුණු විමසීමට පියවර ගෙන ඇත.<br><br>පූගොඩ ගොඩනැගිල්ලේ මුල් ඇස්තමේන්තුව අනුව කළ යුතු සියලු වැඩ මේ වන විට අවසන්ව ඇති අතර අමතර කාර්යයන් කිහිපයක් සඳහා අමතර ඇස්මේන්තුවක් ඉදිරිපත් කර ඇති නමුත් මේ වන විට අදාළ වැය විෂයේ ප්‍රතිපාදන අවසන්ව ඇති බැවින් ඉදිරියේ නව අයවැය ප්‍රතිපාදන ලද පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 කාර්ය සාධන වාර්තාවේ ඇතුලත් ඇතැම් ඡේද සම්බන්ධයෙන් නොගැලපීම් හා සදොස් පැවති අවස්ථා 03ක් නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. | අංශ අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් නිවැරදි වාර්තා ඉදිරිපත් කිරිමට කටයුතු කිරිම. | 8.15 වගුව හා 8.16 වගුව පෙන්වා ඇති දෝෂ පිලිගනී. |

## 3.4 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------------- |
| (අ) | බදු ගණනය කිරීම සඳහා හඳුන්වා දී ඇති රු.745,000 ක් වටිනා පරිගණක වැඩසටහන ප්‍රසම්පදානය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | ප්‍රසම්පාදන කටයුතු සිදුකිරිමේදි තාක්ෂණ ඇගයීම් කමිටුවට විෂය සම්බන්ධ තාක්ෂණික දැනුම ඇති අයෙකු සම්බන්ධ නොවූ අතර මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාමේ පිරිවැය, නඩත්තු කිරිමේ පිරිවැය, මූලික පිරිවැය සහ පූර්ව සේවා සැපයීම් යනාදිය පිළිබඳව අවධානය යෙ◌ාමු නොකර ඉදිරිපත් වු මිලගණන් අතුරින් අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය තෝරාගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධි විධාන ප්‍රකාරව කටයුතු කිරීම. | මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී වැඩි ම මිල ඉදිරිපත් කරන ලද ආයතනය විසින් වගකීම් කාලය පිළිබඳව දක්වා නොමැති අතර, අනෙක් ආයතන දෙකෙන් වැඩි වගකීම් කාලයක් ලබා දී තිබෙන්නේ අඩු ම මිල ඉදිරිපත් කර තිබෙන ආයතනය බැවින් එම ආයතනය තෝරා ගෙන ඇත. |
| (ii) | පරිගණක මෘදුකාංගය දත්ත ඇතුලත් කිරිමෙන් පසු මෘදුකාංගය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකිද යන්න පරීක්ෂා කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනයක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක උපදේශක සහාය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය ආයතනයක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක උපදේශකවරයෙකුගේ සහාය ලබා ගැනීම. | මෙම මෘදුකාංගය සකස් කර ගැනිමේදී පරිගණක තාක්ෂණය පිළිබඳ අර්ධ රාජ්‍ය ආයතනයක් වන ජාතික ව්‍යාපාර කලමනාකාරීත්ව ආයතනයේ තොරතුරු තාක්ෂණික කථිකාචාර්ය/ උපදේශකගේ සේවය ද, සුරාබදු සම්බන්ධව තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයෙකුගේ සේවයද සහ ගණකාධිකරණ සහය ලබා ගැනීම සඳහා ගණකාධිකාරීවරයෙකුගේ ද සහයද ලබා ගන්නා ලද බව සඳහන් කරමි. |
| (iii) | ප්‍රසම්පාදන කටයුතු සිදුකරන අවස්ථාවේදී පශ්චාත් ප්‍රසම්පාදන පිරිවැය පිළිබඳව අවධානය යොමු | පරිගණක මෘදුකාංගය පවත්වාගෙන යාම නඩත්තු කිරීම පිළිබඳ | මෙම මෘදුකාංගය දැනට පවත්නා ආයතනික ව්‍යුහය තුළම භාවිතා කිරීමට හැකි |

| | | | |
|---|---|---|---|
| | කල යුතු අතර පරිගණක මෘදුකාංගය පවත්වාගෙන යාම නඩත්තු කිරීම පිළිබඳ සේවා ගිවිසුමකට 2020 ජනවාරි 20 විගණන දින වන විටත් එළඹ නොතිබුණි. | සේවා ගිවිසුමකට එළඹිය යුතු වීම. | වන ලෙස සකස් කරන ලද බැවින් අමතර වියදමක් දැරීමට සිදු නොවන අතර, අදාළ ආයතනය විසින් වර්ෂයක වගකීම් කාල සීමාවක් ලබා දී ඇත. එබැවින් අමතර සේවා ගිවිසුමකට ඇතුලත් නොවූ බවත්,එම කාල සීමාව අවසානයේ දී විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට සේවා ගිවිසුමකට එලබීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත. |
| (ආ) | අම්පාර, පේදුරුතුඩුව, මුලතිව් සහ පූගොඩ යන ප්‍රාදේශීය කාර්යාල ඉදිකිරීම්වලට අදාල ගොඩනැගිලි සැලසුම් සඳහා අදාල පළාත් පාලන ආයතන / නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. ඉඩමේ අයිතිය පිළිබඳව නිරවුල් කිරීමකින් තොරව හා ගොඩනැගිලි සැලසුම් සඳහා පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අදාල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බව නිරීක්ෂණය විය. | ඉදිකිරීම්වලට අදාල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු කිරීම සහ අධිකාරි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. | පළාත් පාලන ආයතන/ නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම් සිදුකර ඇති අතර අදාළ ලිපි ලේඛන එම ප්‍රාදේශීය කාර්යාලය සතුව ඇත. එම ලිපි ලේඛන පිටපත් ගෙන්වා ගැනීමට කටයුතු කර ඉදිරියේදී එම වාර්තා ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | අංශ 3 කට අයත් කාර්යාල කාමර තුල රාක්ක සවිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.2,112,500 ක් විය. ඒ සඳහා මිල ගණන් කැඳවීම 2018 දෙසැම්බර් 6 සිට 2019 ජුනි 29 යන කාලය තුළ අවස්ථා 3 කදී සිදු කර තිබුණි. එකම කාර්යයක් සඳහා නැවත නැවත මිලගණන් කැඳවීම තුළින් ප්‍රසම්පාදන පිරිවැය ඉහල යාමක් සිදුවන බවත් එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 ඡේදයට පටහැනිව ක්‍රියා කිරීමක් බවත් නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 ඡේදය අනුව කටයුතු කිරීම. | දෙපාර්තමේන්තු රාජකාරී අවශ්‍යතා පැනනගින අවස්ථා අනුව ආදායම් අංශය, බලපත්‍ර අංශය, ලේඛනාගාරය සහ ගණකාධිකාරී (ආදායම්) කාර්යාල කාමරය තුළ කබඩ් (රාක්ක) සවිකිරීම වරින් වර සිදුකල නමුත් ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 ඡේදයට අනුව ක්‍රියාකිරීමට සටහන් කර ගතිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද අයිතම් 10 ක එකතුව වන රු.4,861,556 ක වටිනාකම ප්‍රසම්පාදන සැලැස්මට අන්තර්ගතව නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම නියමිත පරිදි සංශෝධනය කිරීමට කටයුතු කිරීම. | සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අන්තර්ගත කොට නොතිබුණු අයිතමයන් පසුව ඇතුලත් කොට ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කරන ලදී. |

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක 13 සීදුව මූකලංගොමුව නැමැති රා තැබැරුම සඳහා වන වැඩිම ටෙන්ඩර් වටිනාකම රු.4,375,000 ක් ව තිබියදී එම ටෙන්ඩරය දෙවන ටෙන්ඩර්කරු වෙත රු.3,800,505 කට ලබා දීමට පාදක වූ කරුණු මොනවාද යන්න පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර එමගින් රජයට රු.574,495 ක පාඩුවක් සිදුවී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය . | සිදුවිය හැකි පාඩු අවම වන අයුරින් කටයුතු සිදු කල යුතු වීම. | මෙම රා තැබැරුම ටෙන්ඩර් කැඳවීමේදී වැඩිම ටෙන්ඩරය ලෙස රු.4,375,000 ක් ඉදිරිපත් වී ඇත. නමුත් එම ටෙන්ඩර්කරුගේ ටෙන්ඩර් පතේ ඇප තැන්පත් කිරීමේ අඩුපාඩුවක් නිසා ටෙන්ඩර් පත ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව දෙවන ඉල්ලුම්කරුට ටෙන්ඩරය ප්‍රධානය කර ඇත. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිත්වය දරනු ලබන්නේ අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වරයා වේ. ඔහු හා ටෙන්ඩර මණ්ඩලය සියලු කරුණු සලකා බලා තීරණය ගනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | සමබලපත්‍රධාරි ලෙස කටයුතු කරන ලද දෙදෙනකු විසින් ර.බි 4 බලපත්‍රයක් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම අළුත්කර තිබූ අතර දිවුරුම් ප්‍රකාශයක් මඟින් 2018 වර්ෂයේ සිට එක් අයෙකුට බලපත්‍රය නිකුත් කර තිබුණි. එහෙත් 2015 දෙසැම්බර් 15 දිනැති අංක 983 දරන සුරාබදූ නිවේදනය ප්‍රකාරව බලපත්‍ර පැවරීමේ ගාස්තුව වන රු.15,000,000 ක මුදල අයකිරීමට කටයුතු නොකර රු.200,000 ක් පමණක් අයකර තිබුණි. සුරාබදූ නිවේදන අංක 926 ප්‍රකාරව රු.1,300,000 ක මුදලක් අයකර ගත් බව මේ සඳහා යොමුකල විගණන විමසුම සඳහා එවන ලද පිළිතුරෙහි සඳහන් විය. ඒ අනුව තවදුරටත් අයකල යුතු මුදල රු.13,500,000 ක් විය. | සුරාබදූ නිවේදන අංක 983 ප්‍රකාරව නියමිත ගාස්තු අය කර ගැනීමට කටයුතු කිරීම. | අංක 926 සුරාබදූ නිවේදනය දරණ අංක 1680/24 හා 2010 නොවැම්බර් 19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 2 වන ඡේදයට අනුව මෙම මුදල රු.1,500,000 ක් දක්වා සංශෝධනය කර ඇති බැව් කාරුණිකව දන්වමි ඒ අනුව ගෙවිය යුතු ඉතිරි රු.1,300,000 ක මුදල 2020 ජනවාරි 07 දින අංක Z/24-0999384 මුදල් භාර ගැනිමේ කුවිතාන්සිය මගින් ගෙවා ඇති බැව් කාරුණිකව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඇ) වාහන අනතුරු දෙකකට අදාලව අළුත්වැඩියා වියදම රු.817,711 ක් වූ අතර ඒ සඳහා රක්ෂණ වන්දි ලෙස රු.618,489 ක් පමණක් ලැබී තිබුණි. ඉතිරි රු.199,222 ක මුදල මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ එන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට, තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීම් ලෙස වාර්තා කර නොතිබුණි. | නිවැරදි දත්ත මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කිරීමට කටයුතු කිරීම. | පිළිතුරු ඉදිරිපත් නොවීය. |

**3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2020 මාර්තු 12 දින වන විට 2019 ගිණුම් වර්ෂය වෙනුවෙන් විගණන විමසුම් 27 ක් නිකුත් කර තිබූ අතර එම විගණන විමසුම් වලින් විමසුම් 10 කට පිළිතුරු සැපයීම සඳහා මාස 03 ඉක්මවූ කාලයක්ද විමසුම් 10 ක් සඳහා පිළිතුරු සැපයීම මාස 1ත් 3ත් අතර කාලයක් ද ගත වී තිබුණි. විමසුම් 06 ක් සඳහා 2020 ජුනි 01 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දින වකවානු තුළ පිළිතුරු එවීමට ගණන්දීමේ නිලධාරියා විසින් කටයුතු කිරීම. | රටේ පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලවලින් තොරතුරු ලබාගෙන ඉදිරිපත් කල යුතු පිළිතුරු සැපයිමට යම් ප්‍රමාදයක් සිදුව ඇති බැව් පිළිගනිමි. අදාල පිළිතුරු නොපමාව එවන ලෙසට නිලධාරින් දැණුවත් කර ඇති අතර, ඉදිරියේ දී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු කරමි. |

**3.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පළාත් සහකාර සුරාබදු කොමසාරිස් සහ සුරාබදු අධිකාරීවරුන් විසින් ඔවුන්ගේ පළාතේ වෙළදාම පිණිස තබා ඇති රා බෝතල්වලින් සාම්පලයක් තුන්මසකට වරක්වත් ලබාගෙන රස පරීක්ෂක වෙත යොමුකර වාර්තාවක් ලබාගතයුතු වුවත් රත්නපුර අංක 1 හා අංක 2 යන රා | නීතී රීති ප්‍රකාරව කටයුතු කිරීම. | පිළිගනිමි. මාස තුනකට වරක්වත් සාම්පල් ලබාගෙන පරීක්ෂා කලයුතු බවට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | තැබැරුම්වලින් 2017 ඔක්තෝබර් මාසයෙන් පසු 2020 ජනවාරි 29 විගණිත දින තෙක්ම සාම්පල් ලබාගෙන රස පරික්ෂක වෙත යොමු කිරිමට කටයුතු කර නොතිබුණි. | | |
| **(ආ)** | රා තැබැරුම් තක්සේරු කිරිමේදි ඒ ඒ රේන්ද බලපත්‍ර ස්ථානවලින් වාර්ෂිකව වාර්තා වී ඇති පරිභෝජන දත්ත සහ තක්සේරු වාර්තා පිළියෙල කිරිම සඳහා භාවිතා කර ඇති දත්ත අතර ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතුණි. තක්සේරු වර්ෂය සඳහා පාරිභෝගික තක්සේරුව ගණනය කිරිමේදි, රා තැබැරුමට රා සැපයීම සඳහා අනුමත පොල් ගස් සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමුකර ඇති බවක් ද නිරීක්ෂණය නොවීමෙන් නිවැරදි තක්සේරු වටිනාකම ගණනයවීමක් සිදුවේද යන්න ගැටළු සහගතවිය. පිළිතුරට අදාල සනාථ කිරීම් ඉදිරිපත් නොවීය. | රා තැබැරුම් තක්සේරු කිරිමේදි නිවැරදි දත්ත ලබා ගැනීමට කටයුතු කිරිම තුලින් තක්සේරු වටිනාකම ගණනය කිරීමට කටයුතු කිරීම. | රා රේන්ද තක්සේරු කිරීමේදී පසුගිය වසරේ අගෝස්තු මස 01 වන දින සිට අදාල වර්ෂයේ ජූලි මස 31 දින දක්වා කාලය වසරක් ලෙස ගණන් ලනු ලැබේ. එබැවින් එහි සඳහන් වෙනස්කම් සිදු වී ඇති නමුත් තක්සේරු කිරීමේදී වරදක් සිදු වී නොමැති බව ප්‍රකාශ කරමි. |
| **(ඇ)** | බීඩි හා සුරුට්ටු නිෂ්පාදනවලට අදාල බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමෙන් පසු නිෂ්පාදකයන් නැවත ලියාපදිංචිය අලුත් කිරීමට කටයුතු කර නොමැති අවස්ථාවලදී එකී නිෂ්පාදන ආයතන විසින් බලපත්‍රයක් රහිතව තවදුරටත් එම නිෂ්පාදනයන් සිදුකිරීමට ඉඩ ඇති හෙයින් ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් එකී ආයතන පරීක්ෂාවට ලක් කිරීමක් සිදු කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. නියදි පරීක්ෂාවට ලක් වූ ලිපි ගොනු 30 අතරින් අනාවරණය වූ එවැනි ලියාපදිංචිය අලුත් නොකල ආයතන 05 ක් විය. | දෙපාර්තමේන්තුව විසින් නියාමන කටයුතු සිදු කිරීම. | මේ පිළිබඳව අදාල සුරාබදු ස්ථාන දැනුවත් කර ඇත. මෙම ආයතන විසින් ලියාපදිංචි සහතිකයක් නොමැතිව නිෂ්පාදන කටයුතු සිදු වන බවට කිසිදු සුරාබදු ස්ථානයකින් හෝ මහජන පැමිණිල්ලක් හෝ මේ වන තෙක් වාර්තා වී නොමැත. බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය ගෘහ කර්මාන්තයක් ලෙස පෘථුලව ව්‍යාප්තව ඇති බැවින් ඒ ස්ථාන සඳහා නිලධාරින් යෙදවීම ප්‍රායෝගිකව අපහසු මට්ටමක පවතී. |
| (ඇ) | බලපත්‍ර අංශය මගින් සිදුකෙරෙන කාර්යන් වන මත්පැන් ආනයනය හා අපනයනය සහ ස්ප්‍රීතු ආනයනය කිරීමට අදාලව ප්‍රවාහන බලපත්‍ර හා අවසර පත්‍ර ලබා දීම සහ කාර්මික නිෂ්පාදන සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීම හා සම්බන්ධයෙන් කටයුතු සිදුකිරීමේදී පරිගණක වැඩ සටහන් මගින් එ්වා සිදු කිරීමට කටයුතු | සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවන් ලබා දීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම. | විගණනය විසින් පෙන්වා දී ඇති අයුරු බලපත්‍ර අංශයට අදාළ රාජකාරී කටයුතු පරිගණක ගත කිරීමට අදාළ කටයුතු ඉදිරියේ දී සිදු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| | සලසා නොතිබුණි. මේ හේතුවෙන් තොරතුරු හා දත්ත ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදුවීම හා දුෂ්කරතාවයන් පැන නැගී තිබුණි. | | |
| (ඉ) | බලපත්‍ර අංශය දෙපාර්තමේන්තුවේ ප්‍රධානම මෙහෙයුම් ක්‍රියාවලිය සිදුකරනු ලබන අංශයක් වන අතර මෙම අංශයේ ඇති කාර්යයන් පරිගණක මෘදුකාංගයක් හරහා සිදු කිරීමටත් ප්‍රමාණවත් මානව සම්පත් ලබා දීමටත්, නිලධාරීන් වාර්ෂිකව අංශ අතර රාජකාරී මාරු කිරීමත් අවශ්‍ය කටයුතු සිදුකල යුතු බව නිරීක්ෂණය කෙරේ. දෙපාර්තමේන්තුවේ පරිපාලන සහ අභ්‍යන්තර කටයුතු වලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම පහසු වන අයුරින් බලපත්‍ර අංශය ප්‍රතිසංවිධානය කල යුතු බවත් විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | බලපත්‍ර අංශයේ කාර්යයන් විනිවිදභාවය ඇතිවන පරිදි පරිගණක මෘදුකාංගයක් යොදා ගැනීමට කටයුතු කිරීම. | විගණනයේ උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු කිරීමට ඉදිරියේ දී පියවර ගන්නා ලෙසට නිලධාරින්ට උපදෙස් දී ඇත. |
| (ඊ) | 2018 සහ 2019 වර්ෂවලදී ධාවනයෙන් බැහැර කර ඇති වාහන 10 ට අදාලව අපහරණ කටයුතු 2020 ජුනි මස වන විටත් අවසන් කර නොතිබුණි. මෙම රථ ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ ගාල් කර තිබූ අතර අපහරණ කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ලබාගත හැකි ආර්ථික වාසි නොලැබී යාම තුළින් රජයට පාඩු සිදුවීමට ඇති ඉඩකඩ විගණනයේදී බැහැර කල නොහැකි කරුණක් විය. | 2015 ජුලි 15 දිනැති අංක 02/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. | පිළිතුරු ඉදිරිපත් නොවීය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු දෙකක් බාහිර පාර්ශවයේ වරදින් සිදු වී තිබූ අතර එම අනතුරු සම්බන්ධයෙන් අලුත් වැඩියා වියදම් එකතුව රු.885,047 ක් විය. මෙම වියදම බාහිර රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු නොකොට දෙපාර්තමේන්තුවේ රථ රක්ෂණය කර ඇති ආයතනයෙන් ලබා ගැනීමට ක්‍රියා කර තිබීම හේතුවෙන් ඉදිරි රක්ෂණ සිදු කිරීමේදී ලබාගත හැකිව තිබූ වට්ටම් අහිමි වීම මත තව දුරටත් අලාභ සිදු වී ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කල නොහැකි විය. | අනතුරු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයෙන් වන්දි ලබා ගැනීමට කටයුතු කිරීම. | අධිකරණ ක්‍රියාවලියේ ඇතිවන ප්‍රමාදයන් හේතුවෙන් සහ රාජකාරි අවශ්‍යතාවය මත අළුත්වැඩියා කර රක්ෂණ වන්දි මගින් හානිය ආවරණය කර ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි . |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් බැහැර කර තිබූ දුරකථන 28 කට අදාලව දුරකථන ගාස්තු ලෙස රු.230,119 ක් ගෙවා තිබූ අතර 2020 පෙබරවාරි 20 විගණිත දින දක්වාම එම දුරකථන සම්බන්ධතා ක්‍රියා විරහිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ආර්ථික හා ඵලදායිත්වයෙන් යුතුව සම්පත් භාවිතා කිරීමට කටයුතු කිරීම. | පිළිතුරු ඉදිරිපත් නොවීය. |
| (එ) | සී.සී.ටී.වී. දත්ත ගබඩා පද්ධතියේ, දත්තයන් ගබඩා කිරීම උපරිම වශයෙන් මාසයක කාලයක් දක්වා පමණක් විය. පසුගිය කාල වකවානු සඳහා වන දර්ශනයන්ගේ දත්ත ගබඩා විස්තර දෙපාර්තමේන්තුව තුල රඳවා තබා ගැනීමට කටයුතු නොකිරීම තුලින් සී.සී.ටී.වී පද්ධතිය මිලදී ගැනීමට හා නඩත්තුකර පවත්වාගෙන යාමට දරා තිබෙන වියදමෙන් නිසි ප්‍රතිලාභ ලබාගන්නේද යන්න විගණනයේදී ගැටළු සහගත විය. | ආර්ථික හා ඵලදායිත්වයෙන් යුතුව සම්පත් භාවිතා කිරීමට කටයුතු කිරීම. | පිළිතුරු ඉදිරිපත් නොවීය. |
| (ඒ) | ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් අම්පාර, පූගොඩ සහ මහනුවර සුරාබදු කාර්යාල පවත්වාගෙන යන ගොඩනැගිලි වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා කුලී ලෙස එකතුව රු.560,100 ක් ගෙවා තිබුණි. | සැලසුම් සහගතව නියමිත කාලවකවානු තුල ඉදිකිරීම් කටයුතු සිදු කර ගැනීමට කටයුතු කිරීම හා මෙවැනි වියදම් අවම කිරීමට කටයුතු කිරීම. | 2020 වර්ෂය වනවිට ඉදි කරන ලද ගොඩනැගිල්ලේ, කාර්යාලය පවත්වා ගැනිමට අපේක්ෂා කෙරේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ලඟාකර ගත යුතු අරමුණු සහ ඉලක්ක කරා ලඟා වීම පිළිබඳ දෙපාර්තමේන්තුව දැනුවත්ව නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කිරීමට ද කටයුතු සිදුකර නොතිබුණි. | අරමුණු හඳුනාගෙන ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. | 2020 වර්ෂයේ සිට අදාල පරිදි ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 ජුනි 30 දිනට ජොෂ්ඨ මට්ටමේ තනතුරු 20 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් තනතුරු 16 ක්ම අවුරුදු 05 ට වැඩි කාලයක සිට ද, තනතුරු 4 ක් වසර 2 ත් 5 ත් අතර කාලයක සිට ද පුරප්පාඩුව පැවතුණි. මින් තනතුරු 12 ක් සඳහා වැඩබැලීමේ පත්වීම සිදුකර තිබුණි | අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කිරීම. | ජොෂ්ඨ මට්ටමේ තනතුරක් වන සුරාබදු අධිකාරී තනතුරට අදාලව පැවැත්වූ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත තනතුරු 12 ක් පිරවීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ 642/2012 දරන නඩුව විභාග වෙමින් පැවති නිසා එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි විය. මේ වන විට නඩුව අවසන්ව ඇති බැවින් 2020 ජුනි 23 වන දින සම්මුඛ පරීක්ෂණ පවත්වා පත් කිරීම් කටයුතු සඳහා එම ලේඛන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මෙහෙවරට සෘජුවම බලපානු ලබන ජොෂ්ඨ සහ තෘතියික මට්ටම්වල තනතුරු ජ්‍යෙෂ්ඨ 77 ක් 2015 සහ 2016 වර්ෂවල සිට පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්ය සාධනයට අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කිරීම. | තෘතීය මට්ටමේ තනතුරු සඳහා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ 661/2012 හා 663/212 දරන නඩු විභාග වෙමින් පැවති නිසා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි විය. මේ වනවිට නඩු අවසන්ව ඇති බැවින් 2020 ජුනි 12 වන දින කුසලතා මත උසස්වීම් 34 ක් සඳහා පත්වීම් ලබා දී ඇත. සීමිත තරඟ විභාගයේ ප්‍රථිඵල මත තනතුරු 51 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. ඊට අමතරව සීමිත තරඟ විභාගයේ ප්‍රථිඵල මත සුරාබදු පරීක්ෂක තනතුරු 17 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, ඉතිරි තනතුරු 38 සඳහා බඳවා ගැනීමේ කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | | විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල ලැබීමෙන් පසු කටයුතු කරනු ඇත. |
| (ඇ) | නිෂ්පාදන සමාගම් 7 කට අදාලව ස්කාගාර හා නිෂ්පාදනාගාර සඳහා සුරාබදු නිලධාරීන් යෙදවීමේදී අනුමත සංඛ්‍යාව ඉක්මවා සුරාබදු නිලධාරීන් 4 ක් අනුයුක්ත කර තිබුණු අතර අනුමත නොවූ තනතුරු සඳහා තිදෙනෙක්ද අනුයුක්ත කර තිබුණි. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත කාර්ය මණ්ඩලය පමණක් යෙදවීමට කටයුතු කිරීම. | ඉහල සුරාබදු ආදායමක් ලැබෙන නිෂ්පාදන සමාගම්වල සේවය සඳහා වැඩිපුර කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර ඇත. |